ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
தேசிய கொள்வனவு ஆணைக்குழு
**National Procurement Commission**

NPC/ESTAB/2016/02
30 th May 2016

ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
අමාත්‍යමණ්ඩල ලේකම,
සියළුම අමාත්‍යංශ ලේකම්වරුන්

<u>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනයෙහි XIX බී පරිදි පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද බව ඔබ වෙත සතුටින් දන්වමු.

2.ඒ අනුව කොමිෂන් සභාව වෙත පවරන ලද කාර්යයන් වනුයේ සියළු රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ හා සේවා වැඩ උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ යුක්ති සහගත විනිවිද පෙනෙන සුළු තරඟකාරී සහ වියදම් සඵලතාවයකින් යුතු පරිපාටි සහ උපමාන සකස් කිරීම සහ එකී උපමාන ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කිරීම වේ.

3.මෙහි සඳහන් රජයේ ආයතන යටතට අමාත්‍යාංශ රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර සහ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සළකනු ලබන්නා වූද රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පලාත් පාලන ආයතනයක් හෝ විසින් 50% ට වැඩි කොටසක් දරන්නාවූ යම් සමාගමක් ද ඇතුලත්වේ.

4.රාජ්‍ය ප්‍රසම්පාදන කාර්ය සම්බන්ධයෙන් පරිපාටි සහ උපමාන සකස් කිරීමේ කාර්යයට වැඩිමනත් වශයෙන් මෙම කොමිෂන් සභාව විසින් පහත සඳහන් කර ඇති කාර්යයන්ද ඉටුකල යුතුවේ.

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ හා සේවා වැඩ උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සම්පාදනය පූර්වයේ අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මයනට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන ක්‍රම මත පදනම් වී ඇත්ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම.

(ආ)රජයේ ආයතන වල භාණ්ඩ හා සේවා වැඩ උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සඳහාවූ සියළුම සුදුසුකම් ලත් ලංසු කරුවනට එකී භාණ්ඩ හා සේවා සැපයීම සඳහාවූ ලංසු තැබීමෙ ක්‍රියාවලියට සහභාගිවීම පිණිස සමාන අවස්ථා ලබාදී ඇත්ද යන්න පිළිබඳව නියාමනය කොට අදාල බලධරයන් වෙත වාර්තා කිරීම.

(ඇ) රජයේ ආයතන වලට භාණ්ඩ හා සේවා වැඩ උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් කරුවන් තේරීම සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පරිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙන සුලු වන්නේද යන්න පිළිබඳව නියාමනය කොට අදාල බලධරයන් වෙත වාර්තා කිරීම.

(ඈ)රජයේ ආයතන විසින් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පත් කරනු ලබන ප්‍රසම්පාදනය කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇතිද යන්න පිළිබඳ වාර්තා කිරීම.

(ඉ) රජයේ ආයතන විසින් පිළිගත් පරිපාටි වලින් සහ මෙහෙයුම් නිර්ණායක වලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිවයුතු නිළධරයින් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාල බලධාරීන් වෙත වාර්තා කිරීම.

ඉහතින් සඳහන් කරන ලද කර්ථව්‍යයන් කාර්යක්ෂම අන්දමින් ඉටුකිරීම සඳහා මෙම කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 19 වෙනි සංශෝධනයේ අංක 156 ඩී මගින් පහත සඳහන් පරිදි බලතල පවරනු ලැබ ඇත.

156 ඩී

(1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට ලිඛිත දැනුම් දීමක් මගින්

(අ) ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට

කොටුගැස්සලි අංක 02, කාමර 2/211, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.
☎ : 011 267 4128, 011 269 1131-34 දිගුව - සභාපති: 161, මහ ලේකම්: 163, අතිරේක මහ ලේකම්: 181
கட்டிட இல 02, அறை 2/211, பண்டாரநாயக்க சர்வதேச மாநாட்டு மண்டபம், கொழும்பு- 07.
☎ : 011 267 4128, 011 2691131-34 நீடிப்பு - தலைவர்: 161, செயலாளர் நாயகம்: 163, மேலதிக செயலாளர் நாயகம்: 181
Block No. 02, Room 2/211, Bandaranaike Memorial International Conference Hall (BMICH), Colombo 07
☎ : 011 267 4128, 011 269 1131-34 Ext - Chairman: 161, Secretary General: 163, Addl. Secretary General: 181

(ආ) එකී දැන්වීමෙ නිශ්චිතව දක්වනු ලබන්නාවූ ද එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නාවූ යම් ලේඛනයක් හෝ යම් දෙයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු බවට නියෝග කළ හැකි වන්නේය.

(11)(අ) ඉහත සඳහන් 1 අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට නියම කරනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව එසේ කිරීමට අපොහොසත්වන

(ආ)එසේ දැනුම් දීමකින් පසුව එසේ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින එහෙත් කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්ණයකට පිළිතුරුදීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ

(ඇ) ඉහත 1 අනු ව්‍යවස්ථාව යටතේ යම් තැනැත්තකු වෙත යවන ලද දැන්වීමක් මගින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ වෙනත් යමක් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේදී රුපියල් ලක් ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු 7 නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම ට හෝ එකී දඩය සහ බන්ධනා ගාර ගතකිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේය.

(111) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 පී ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකටම ඉහත (2) වන අනු ව්‍යවස්ථාවෙහි සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණයක් දීමට අධිකරණ බලය ඇත්තේය.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව එම කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පවරන ලද ඉහත කී සියළු බලතල කාර්යක්ෂම අන්දමින් ඉටු කිරීම සඳහා ඔබ තුමන් /ඔබ තුමියන් සමග සහයෝගයෙන් කටයුතු කරමින් මෙ රටෙහි කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රමවේදයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අපේක්ෂා කරයි.

ඒ අනුව (අ) මෙම චක්‍රලේඛයෙහි අඩංගු තොරතුරු ඔබ අමාත්‍යංශයේ කාර්ය භාරය යටතට ගැනෙන ඉහත 3 හි සඳහන් වන ආයතන ප්‍රධානීන් වෙත දන්වා යැවීමටත්

(ආ) ඔබගේ අමාත්‍යංශය යටතේ ඇති එම ආයතන පිළිබඳව එම ආයතන ප්‍රධානීන්ගේ නම් තනතුරු නාමයන් ලිපිනයන් සහ සම්බන්ධ කරගත හැකි දුරකථන සහ විද්යුත් තැපැල් ලිපිනයන් මා වෙත පහත සඳහන් ලිපිනයට දන්වා එවීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

සීතා විතානආරච්චි
මහ ලේකම්
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
පිටපත: මහ ලේකම් ජාතික ව්‍යවස්ථාදායක සභාව

ගොඩනැගිලි අංක 02, කාමර 2/211, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,කොළඹ 07.
☎ : 011 267 4128, 011 269 1131-34 දිගුව - සභාපති: 161, මහ ලේකම්: 163, අතිරේක මහ ලේකම්: 181

கட்டிட இல 02, அறை 2/211, பண்டாரநாயக்க சர்வதேச மாநாட்டு மண்டபம், கொழும்பு- 07.
☎ : 011 267 4128, 011 2691131-34 நீடிப்பு - தலைவர்: 161, செயலாளர் நாயகம்: 163, மேலதிக செயலாளர் நாயகம்: 181

Block No. 02, Room 2/211, Bandaranaike Memorial International Conference Hall (BMICH), Colombo 07
☎ : 011 267 4128, 011 269 1131-34 Ext - Chairman: 161, Secretary General: 163, Addl. Secretary General: 181